මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2019

13 ශ්‍රේණිය　　　　　　　　　　　　　　　　　　කාලය පැය 03

නාට්‍ය හා රංග කලාව (57)
සිංහල ( I පත්‍රය )

I කොටස - සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
II කොටස - A හා B කොටස් වලින් ප්‍රශ්ණ හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

❖ නිවැරදි පිළිතුර තෝරා, එහි අංක ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

(01) පහත දැක්වෙන විවිධ වර්ගීකරණ වලට අයත් කලාවන් අතරින් ප්‍රාසාංගික කලා තුනක් සහිත පිළිතුර වනුයේ, ( )

I ) නාට්‍ය කලාව, චිත්‍ර කලාව, කැටයම් කලාව
II) චිත්‍ර කලාව, කැටයම් කලාව, මූර්ති කලාව
III) නාට්‍ය කලාව, බැලේ, මුද්‍රා නාට්‍ය
IV) බැලේ, නර්තනය, චිත්‍ර කලාව
V) චිත්‍ර කලාව, බැලේ, ඔපෙරා

(02) නෘත්ත හා නෘත්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වනුයේ, ( )

I) නෘත්ත හා නෘත්‍ය යන්න සඳහන් වන්නේ ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රයේය.
II) නෘත්ත හා නෘත්‍ය යන අංගයන් නාට්‍යයට වඩා ප්‍රබල වේ.
III) මේ සඳහා සතර අභිනයම යොදා ගැනීම අනිවාර්ය වේ.
IV) නෘත්ත යනු ශුද්ධ නැටුම ලෙසත් නෘත්‍ය යන්නෙන් කිසියම් අදහසක් ඉදිරිපත් කරමින් සිදු කරනු ලබන නර්තනය ලෙසත් හැඳින්විය හැක.
V) නාට්‍ය ශාස්ත්‍රයෙහි මේ පිළිබඳ සඳහන් නොවේ.

(03) "රසිකයෙක්" යනු, ( )

I) ඕනෑම ප්‍රේක්ෂකයෙකු හඳුන්වන නාමයකි.
II) නාට්‍යයක් රසවත්ව ඉදිරිපත් කරන්නාය.
III) උසස් නිර්මාණයක් කිරීමට සමත් කලාකරුවාය.
IV) සහෘදයා යන්නට සමානාර්ථය දේ.
V) ප්‍රතිභා හා ව්‍යුත්පන්න ශක්තීන්ගෙන් යුක්ත වූවකි.

(04) නාට්‍ය පෙලක ස්වභාවය තුල නොතිබිය හැකි ගුණයක් වනුයේ, ( )

I) සිද්ධීන් තර්කානුකූලව පෙල ගස්වා තිබීම.
II) සියලු සිද්ධි කාලානුරූපීව ගොඩ නගා තිබීම.
III) නාට්‍යෝචිත අවස්ථාවලින් යුක්ත වීම.
IV) රංග විධාන ඇතුලත්ව තිබීම.
V) සංවාද ස්වරූපයෙන් වස්තුව ගොඩ නැගීම.

www.artsapi.lk

(05) භරතමුණි දක්වා ඇති ආකාරයට ලෝක ධර්මී ශෛලිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ, (   )

I) ලෝකයේ සිදු වන දෑ ඒ අයුරින්ම ඉදිරිපත් කිරීමයි.
II) අංග චලනයන් යම්කිසි තාලානුකූල බවකින් ඉදිරිපත් කරන රංග ශෛලියයි.
III) ලෝකයේ සිදු වන දෙයට බෙහෙවින් සමාන ලෙස ඉදිරිපත් කරන රංග රීතියයි.
IV) කාව්‍යාත්මක ලෙස සංවාද රචනා කරනු ලබන රංග ශෛලියයි.
V) සංකේතාත්මක පසුතල නිර්මාණ භාවිතය විශේෂ ලක්ෂණය කොට ගත් රංග රීතියයි.

(06) පත්තිනි දේවිය ඇදහීමක් ලෙස පවත්වනු ලබන පූජා කර්මයක් ලෙස සැලකිය හැක්කේ, (   )

I) රිද්දි යාගය
II) සොකරි
III) වඩිග පටුන
IV) කෝලම්
V) නාඩගම්

(07) කොහොඹ කංකාරිය ශාන්ති කර්මය තුල දක්නට නොලැබෙන පූජාංගයක් නොවන්නේ, (   )

I) වැදි යක්කම
II) ගුරුගේ මාලාව
III) වඩිග පටුන
IV) ගබඩා කොල්ලය
V) ඌරා යක්කම

(08) නානු මුර පෙලපාලිය හා සූනියම් යක්ෂණියගේ අවතාර තුන පැමිණීමේ අවස්ථාව ඇතුළත් ශාන්ති කර්ම අයත් සම්ප්‍රදායන් වන්නේ, (   )

I) පහතරට හා පහතරට
II) පහතරට හා උඩරට
III) උඩරට හා පහතරට
IV) සබරගමු හා උඩරට
V) පහතරට හා සබරගමු

(09) "නමින් පසිදු දඹදිව තල පඩිපුර රජ කළ නිරිඳුට යොදුන් ගණන් අඹ උයනක් විය එහි මැද සැදුණු යසට" ඉහත කවි පන්තිය ඇතුළත් යාතු කර්මය වන්නේ, (   )

I) දෙවොල් මඩු ශාන්ති කර්මය
II) කොහොඹා කංකාරියේය
III) සන්නි යකුම
IV) මහසෝන් සමයම
V) දහඅට සන්නිය

(10) 'උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම් තැන්නෙන් ගෙනාවා'
ඉහත කවි පන්තිය ඇතුළත් ශාන්ති කර්මය වන්නේ, (   )

I) මැණික්පාල ශාන්ති කර්මයේ
II) සූනියම් යාගය
III) රට යකුම
IV) මහසෝන් සමයම
V) කොහොඹ කංකාරිය

(11) නූර්තිය නාඩගමින් වෙනස් වන විශේෂ ලක්ෂණය වන්නේ, (   )

I) යක් බෙරය භාවිතා කිරීමයි.
II) නාට්‍ය පෙලක් තිබීමයි.
III) ගීත අඩංගු වී නොතිබීමයි.
IV) කාන්තාවන් රංගනයේ යෙදීමයි.
V) රාත්‍රියක් පුරා රඟ දක්වනු ලැබීමයි.

www.artsapi.lk

(12) නාඩගම සම්බන්ධයෙන් අදාළ නොවන්නේ, ( )

I) නිශ්චිත පිටපතක් නොතිබීම.
II) කර්ණාටක සංගීතය භාවිතා කිරීම.
III) පිරිමින් පමණක් රංගනයේ යෙදීම.
IV) පොතේ ගුරු හා ගායක කණ්ඩායමක් සිටීම.
V) නාට්‍ය ධර්ම සම්ප්‍රදාය අනුගමනය කිරීම.

(13) සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණයක් වන්නේ, ( )

I) විශේෂයෙන් සකස් කළ වෙස් මුහුණු නොපැළදීමයි.
II) කාන්තාවන් රංගනයේ යෙදීමයි.
III) ස්ථාවර පාත්‍රයන් අන්තර්ගත වීමයි.
IV) කමතක රඟ දැක්වීමයි.
V) ගායනා අන්තර්ගත නොවීමයි.

(14) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවේ අභිවෘද්ධියට වෙසෙසින් දායක වූයේ, ( )

I) W.A ද සිල්වා
II) රෙජී සිරිවර්ධන
III) සතිස්චන්ද්‍ර එදිරිසිංහ
IV) E.F.C.ලුඩොවයික්
V) හෙන්රි ජයසේන

(15) ශ්‍රී ලංකාවේ පාස්කු රඟ දක්වන ප්‍රදේශ වනුයේ, ( )

I) මහනුවර, මාතලේ, බදුල්ල හා යාපනය
II) පමුණුගම, මහනුවර, හලාවත හා කොළඹ
III) පිටිපන, බදුල්ල, යාපනය හා දූව
IV) හලාවත, මීගමුව, පිටිපන හා දූව
V) පමුණුගම, මතුගම, දූව හා පිටිපන

(16) ‘සුවඳ පද්ම ඕලු ආදී‘ ගීතය ඇතුළත්ව ඇත්තේ, ( )

I) පද්මාවතී නූර්තියෙහි
II) දුටුගැමුණු නූර්තියේ
III) මොයනාය නූර්තියේ
IV) සිරිසඟබෝ නූර්තියෙහි
V) කුස නාඩගමේ

(17) නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බෞද්ධ පූජා කර්මයක් වන්නේ, ( )

I) ආලවක දමනය
II) කොහොඹා කංකාරිය
III) දෙවොල් මඩු
IV) පහන් මඩු
V) අඹ විදමන

(18) දෙමළ නාට්‍ය කලාව හා සම්බන්ධ නොවන්නේ, ( )

I) වඩමෝඩ් කුත්තු
II) තෙරුක්කුත්තු
III) තෙන්මෝඩ් කුත්තු
IV) මකිඩ්
V) නූර්ති

www.artsapi.lk

(19) මිනර්වා නාට්‍ය ව්‍යාපාරයේ පුරෝගාමියා වනුයේ, ( )

I) B.A.W. ජයමාන්න II) E.F.C. ලුඩොවයික් III) එදිරිවීර සරත්චන්ද්‍ර
IV) දයානන්ද ගුණවර්ධන V) සයිමන් නවගත්තේගම

(20) නූතන ශ්‍රී ලංකාවේ ලෝක ධර්ම නාට්‍ය කලාවේ පුරෝගාමියා වූයේ, ( )

I) දයානන්ද ගුණවර්ධන II) හෙන්රි ජයසේන III) සුගතපාල ද සිල්වා
IV) එදිරිවීර සරත්චන්ද්‍ර V) බන්දුල ජයවර්ධන

(21) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් නිෂ්පාදනය කළ නාට්‍යකරුවන් වන්නේ, ( )

I) රාජිත දිසානායක II) ජනක් ප්‍රේමලාල් III) කේ.බී.හේරත්
IV) කපිල කුමාර කාලිංග

(22) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍යයක් නොවන්නේ, ( )

I) කදා වළලු II) ඒකට මට හිනා III) වෙද හටන
IV) එලොව ගිහින් මෙලොව ආවා V) ජනේලය

(23) 'කුත්තු' සම්බන්ධයෙන් නොගැලපෙන වරණය වන්නේ, ( )

I) කුත්තුවේ විවිධ චරිත සඳහා අනන්‍ය වූ වේෂභූෂණ ඇත.
II) එක් එක් චරිතයකට ආවේණික නර්තන විලාස ඇත.
III) කුත්තු රඟ දක්වන්නේ ශෘහස්ථ වේදිකා තුලය.
IV) කුත්තු වලට වස්තු විෂයය වී ඇත්තේ මහා භාරතය, රාමායනය ආදී දකුණු භාරතීය කෘතිවල එන කථාය.
V) නාට්‍ය මෙහෙයවන්නා අන්නාවියාර් ලෙස හඳුන්වයි.

(24) 'විභාව' යනු, ( )

I) රසයක් ඉපැදවීමට හේතුවන මනෝභාවයකි.
II) ස්ථායීභාවයක් අවදි කරවීමට හේතුකාරක වන්නා වූ සාධකයකි.
III) 'අනුභාව' යන්නට පර්යායවාචී ශබ්දයකි.
IV) සාත්ත්වික භාවයන්ගෙන් එකකි.
V) මනසේ පරිපාලනයකින් තොරව බිහි වන්නා වූ ශාරීරික ප්‍රතික්‍රියා විශේෂයකි.

(25) නාඩගම් සංගීතය සඳහා වැඩි වශයෙන් යොදා ගනු ලබන වාද්‍ය භාණ්ඩ වන්නේ, ( )

I) මද්දලය II) පහතරට බෙරය III) හොරණෑව
IV) යක් බෙරය V) ගැටබෙරය

www.artsapi.lk

| නාට්‍ය රචකයා | නාට්‍ය කෘතියේ නම | සිංහල පරිවර්තනයේ නම | සිංහල නිෂ්පාදකගේ නම |
|---|---|---|---|
| A<br>...................... | ද කොකේසියන් චොර්ක් සර්කල් | B<br>.......................... | හෙන්රි ජයසේන |
| C<br>.................... | වෙයිටිං පෙෆාර් ගොඩෝ | ගොඩෝ එනකං | J. සෙල්වදොරේ |
| D<br>................... | මදර් කරේජ් | දිරිය මව සහ ඇගේ දරුවෝ | E<br>.......................... |

(26) 'A' අක්ෂරය අදාළ නාට්‍ය රචකයා වන්නේ, ( )

I) බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් II) හෙන්ඩ්‍රික් ඉබ්සන් III) විලියම් ශේක්ෂ්පියර්
IV) සැමුවෙල් බෙකට් V) E.F.C. ලුඩොවයිට්

(27) 'B' අක්ෂරයට අදාළ නාට්‍ය වනුයේ, ( )

I) බෝඩිංකාරයෝ II) හුණුවටයේ කථාව III) තට්ටු ගෙවල්
IV) නන්දි විසාල V) මාරාසාද්

(28) 'C' අක්ෂරයට අදාළ නාට්‍ය රචකයා වන්නේ, ( )

I) ඔගස්ට් ස්ට්‍රිංබර්ග් II) බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් III) සැමුවෙල් බෙකට්
IV) විලියම් ශේක්ෂ්පියර් V) හෙන්ඩ්‍රික් ඉබ්සන්

(29) 'D' අක්ෂරයට අදාළ නාට්‍ය රචකයා වන්නේ, ( )

I) ෂොන් පොල් සාත්‍රේ II) ජීන් ජේන් III) හැරල්ඩ් පින්ටර්
IV) ඔගස්ට් ස්ට්‍රිංබර්ග් V) සැමුවෙල් බෙකට්

(30) 'E'අක්ෂරයෙන් දැක්වෙන ලාංකික නාට්‍යකරු වන්නේ, ( )

I) හෙන්රි ජයසේන II) ගුණසේන ගලප්පත්ති III) ධම්ම ජාගොඩ
IV) බන්දුල විතාන V) ධර්මසිරි බණ්ඩාරනායක

- පහත දැක්වෙන පිළිතුරු උපයෝගී කරගෙන 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.නිවැරදි පිළිතුරේ අංකය වරහන් තුල ලියා දක්වන්න.

A - කරදිය B - වෙස් අත්ත C - චිත්‍ර වස්ත්‍ර D - බිජ E - ධීර ලලිත

(31) චිත්‍රසේන මහතා විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය වන්නේ, ( )

(32) සකු නාට්‍ය කලාව තුල කථානායකයා වර්ග කළ හැකි ආකාරයක් වනුයේ, ( )

(33) තානායම්පල රංග භූමිය තුල දක්නට ලැබිය හැකි ලක්ෂණයක් වන්නේ, ( )

(34) සංස්කෘත නාට්‍යයක කථා වස්තුව ගලා යාමේදී දැකිය හැකි අවස්ථාවක් වනුයේ, ( )

www.artsapi.lk

(35) නාඩගම් රංග භූමිය තුල දක්නට ලැබිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ, ( )

- අංක 36 - 40 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු 5 බැගින් ලබා දී ඇත. ඒ අතරින් සෙසු පද හා නොගැලපෙන පදයේ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති වරහන තුල ලියන්න.

(36) A - කරලිය B - මද්දලය C - පිලිප්පු සිංඤෝ D - වෙස් අත්ත
E - බහුබූතයා ( )

(37) A - බීජ B - බිංදු C - අනාවරණ D - පතාකා E - ප්‍රකරි ( )

(38) A - ශ්වසන අභ්‍යාස B - සංවේදන අභ්‍යාස C - කටහඬ අභ්‍යාස D - මීයෝ සහ පූසෝ
E - ශිථිලකරණය ( )

(39) A - අරම්භ B - යත්න C - ආකුලිකරණ D - නියතාප්ති E - ඵලාගම ( )

(40) A - රූපණය B - අංගරචනය C - රංගාලෝකරණය D - වේෂභූෂණය
E - පසුතල නිර්මාණකරණය ( )

## II කොටස

- එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

### A කොටස

(01) I. සුභ සහ යස නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා නම් කරන්න. (ල. 5)
II. සුභ සහ යස නාට්‍යයේ ගැටුම ආරම්භ වන්නේ කවර අවස්ථාවේදැයි පැහැදිලි කරන්න. (ල. 5)
III. සුභ සහ යස නාට්‍යයේ තේමාව පැහැදිලි කරන්න. (ල. 5)

(02) I. සංස්කෘත නාට්‍ය තුල දැකිය හැකි අර්ථ ප්‍රකෘති 05 ලියා දක්වන්න. (ල. 5)
II. ඉන් දෙකක් පිළිබඳ රත්නාවලි/ අභිඥාණසාකුන්තලය යන නාට්‍යන්ගෙන් එකක උදාහරණ සහිතව පහදන්න. (ල. 5)
III. සංස්කෘත නාට්‍ය රඟ දැක්වීමට භාවිතා කර රංග භූමි නම් කර ඉන් එකක් ඇඳ දක්වන්න.(ල.5)

(03) I. කුවේණි නාට්‍ය පෙළෙහි හා පුරාවෘත්තයට අනුව කුවේණි හි දක්නට ලැබෙන වෙනස්කම් 02 ක් ලියන්න. (ල. 5)
II. එම වෙනස්කම් නාට්‍යයේ සාර්ථකත්වයට බලපා ඇති ආකාරය විමසන්න. (ල. 5)
III. කුවේණි නාට්‍යයේ චරිත නිර්මාණය විස්තර කරන්න. (ල. 5)

www.artsapi.lk

## B කොටස

(01)I. කෝලම් සඳහා භාවිතා කළ රංග භූමිය නම් කරන්න. (ල. 5)

II. එම රංගභූමියේ රූප සටහන් ඇඳ නම් කරන්න. (ල. 5)

III. කෝලම් රංග ශෛලිය කෙටියෙන් නම් කරන්න. (ල. 5)

(02)I. ශ්‍රී ලාංකික නාට්‍ය කලාවේ සංදිස්ථානයක් ලෙස සැලකෙන මනමේ නාට්‍ය බිහි වූ වර්ෂය කුමක්ද? (ල. 5)

II. මනමේ නාට්‍ය සඳහා පාදක කර ගත් වස්තු විෂයය ඇතුළත් ජාතක කථාව කුමක්ද? (ල. 5)

III. ජාතක කථාව හා මනමේ නාට්‍ය අතර ඇති කළ ප්‍රබල වෙනස්කම පැහැදිලි කරන්න.(ල. 5)

(03)I. ශ්‍රී ලාංකික නූතන නාට්‍ය කලාව තුල විශාල මෙහෙයක් කළ නාට්‍යකරුවන් 03 ක් නම් කරන්න. (ල. 5)

II. ඉන් එක් නාට්‍යකරුවෙකු නාට්‍ය කලාවට සිදුකළ මෙහෙය විස්තර කරන්න. (ල. 5)

III. ලාංකීය නාට්‍ය කලාවේ පෝෂණය සඳහා විශ්ව විද්‍යාලීය විද්‍යාර්ථයින් විසින් ඉටු කරන මෙහෙය විස්තර කරන්න. (ල. 5)

www.artsapi.lk